**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

**(අ)** ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා ලබාගත් ණය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය සාවද්‍ය ගිණුම්කරන ගැලපීම් හේතුවෙන් ජංගම නොවන වගකීම් රු. 7,610,281 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**(ආ)** 2014 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.2,584,263 කින් වැඩි වී තිබුණු නමුත් ඒ පිලිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලබාදුන් ගැල්වනයිස් බට 160 ක වටිනාකම රු.177,143 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වලින් විධිමත් අනුමැතියකින් තොරව විෂයයන් 4 කින් රු.10,841,953 ක වටිනාකමක් ඉවත් කර තිබූණු අතර ඒ සම්බන්ධයෙන් පොත්වල කිසිදු සටහනක් තබා නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.78,641,819 ක්වූ වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන් 14 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි/ පැවැත්ම තහවුරු කිරීමේ ලියවිලි/විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.7,205,412 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු මෙහෙයුම් අතිරික්තය රු. 2,287,765 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 කඩ බදු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කඩ කාමර 30 කින් අයවිය යුතුව තිබෙන හිඟ කුලී රු.475,624 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1994 අගෝස්තු 04 දිනැති NCP/LG/4/7/19 චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරුවකුගේ තක්සේරුව පදනම්ව කඩ කාමර කුලී තීරණය කළයුතු වුවත්, පොදු වෙළඳපල කඩ කාමර කුලී වසර 21 කට පෙර සභාව තීරණය කරන ලද ප්‍රමාණයන් මත අයකරමින් පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

(අ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් වටිනාකම රු.177,143 ක්වූ ගැල්වනයිස් බට 160 ක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණ ආරම්භ කර නොතිබුනි.

(ආ) මූල්‍ය ප්‍රකාශන වල වර්ෂ 05 කට අධික කාලයක සිට ඉදිරියට එමින් පවතින රු.3,097,564 ක්වූ ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් සමාලෝචිත වර්ෂයේ දීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවකයින් 16 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක සිට අයවිය යුතුව පවත්නා තොරතුරු සොයාගත නොහැකි බවට සඳහන් කරන ලද අයවිය යුතු ණය එකතුව රු.225,002 ක් වූ අතර එම ණය ශේෂ අදාල ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) ටෙන්ඩර් ඇප තැන්පත් ලේඛනය අනුව 2001 වර්ෂයේ සිට 2012වර්ෂය දක්වා ආපසු නොගෙවන ලද තැන්පත් වටිනාකම් එකතුව රු.224,418 ක්වූ අතර ඒවා ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය.

(ඇ) වත්කම් කළමනාකරණය